**පරන්තන් කෙමිකල්ස් සමාගම - 2023**

---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පරන්තන් කෙමිකල්ස් සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05 ක් ඉක්ම වූ රු.3,687,446 ක ණයගැති ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් පියවා දමන ලෙස දන්වා ලිපි යොමුකර ඇත. | අයකර ගැනීමට හෝ ඉවත්කිරීමට පියවර ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 25 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ක්‍රියාත්මක කිරීම පනතේ 02 ඡේදය | කවර හෝ පුද්ගලයෙකු හෝ ආයතනයක් විකුණුම් මත සියයට 2.5 ක සමාජ ආරක්ෂණ බද්දක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ රු.768,985,296 ක් වූ සමාගමේ විකුණුම් ආදායමින් සියයට 2.5 ක් වන රු.19,224,632 ක සමාජ ආරක්ෂණ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. | 2024 වර්ෂයේ දී ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.479,965,403 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.362,358,886 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.117,606,517 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ක්ලෝරීන් සිලින්ඩර් , කෝස්ටික් සෝඩා දියර, බ්ලීචිං දියර විකුණුම් ආදායම පිළිවෙලින් රු.73,357,165 ක් රු.2,713,006ක් රු.4,835,889 ක් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.59,605,380 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 07 දින බංගලාදේශය වෙත හිස් ක්ලෝරීන් සිලින්ඩර් 42 ක් රැගත් බහලුම් 3 ක් ක්ලෝරීන් සැපයුම් ආයතනය වෙත යැවීමේදී එම බහලුම් නිදහස් කර ගැනීමට අදාළ ලියකියවිලි නියමිත වේලාවට යැවීමට අපොහොසත් වීම හේතුවෙන් එම ආයතනය වෙත රු.6,830,145 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සමාගමට සිදු වී තිබුණි. ඊට අදාල පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන පරීක්ෂණ වාර්තාව නිකුත් කර නොමැති අතර, මෙම පරීක්ෂණය ඉතා ඉක්මනින් අවසන් කර ලබාදෙන මෙන් අප ආයතනය මඟින් දැනුම් දී ඇත. | සමාගමට අලාභයන් ඇති නොවන ලෙස කටයුතු කිරීමට කළමනාකරණය වගබලා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී අවශ්‍ය ප්‍රමාණය පුරෝකතනය කිරීමකින් තොරව බංග්ලාදේශයෙන් රු.38,644,540 ක් වටිනා කි.ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා බෑග් 5,997 ක් මිලදී ගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම තොගයෙන් රු.15,022,368 ක් වටිනා කි.ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා බෑග් 1,869 ක් එනම් සියයට 31 ඉතිරි වී තිබුණු අතර, එම තොගයෙහි කල් ඉකුත්වීමේ දිනය 2023 අගෝස්තු 26 දින වීම හේතුවෙන් එම තොගය කල් ඉකුත් වී තිබුණි. | අපේක්ෂා කළ පරිදි රාජ්‍ය ආයතනවලින් ස්ථිර ලෙස ඇණවුම් ලබා නොදීම හේතුවෙන්, එම තත්ත්වයට මුහුණ දීමට සිදු විය. | අවශ්‍යතාව හඳුනාගෙන තොග ඇණවුම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අක්කර 227 කින් යුත් පරන්තන් භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබුණු අතර, ඒ සඳහා 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් හා පරන්තන් ඉඩම සංවර්ධනය හා ශාක වගා කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.7,611,110 ක් හා රු.5,483,617 ක් ලෙස වියදම් දරා තිබුණද, යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | ශක්‍යතා අධ්‍යයන කාර්යයන් අවසන් කලද ඊට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කල අතර මෙම ආයතනය ප්‍රතිව්‍යුහගතකරණයට යටත් කරන ලද බැවින් ව්‍යාපෘතියට අදාල සියළු කටයුතු එම ඒකකය හරහා සිදු කෙරෙනු ඇත. | ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකාවේ පානීය ජල සුරක්ෂිතතාවට අවශ්‍ය දියර ක්ලෝරීන් ආනයනය කර ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට බෙදා හැරිම හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (HCL) සහ සෝඩියම් හයිපොක්ලෝරයිට් රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි සමාගම නිරතව සිටින බැවින් ශ්‍රී ලංකාව තුළ යූරියා පොහොර නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පෞද්ගලික) ආයතනය මඟින් ශක්‍යතා අධ්‍යනයක් කරවා ගැනීමට 2020 දෙසැම්බර් 31 දින රු.35,353,000 ක් ආයතනය ලබා දී තිබුණ ද, 2023 වර්ෂය අවසන් වන විටත් කාර්යය ඉටු කරවාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් අප ආයතනය හා නැනෝ තාක්ෂණ ආයතනය අතර මුදල් අමාත්‍යංශයේ දී පැවැති අතර, එම කාර්යය නැවත ආරම්භ කරන ලෙස අමාත්‍යංශ නිලධාරීන් විසින් දන්වා ඇත. නැනෝ තාක්ෂණ ආයතනයට අදාල එම මුදල ස්ථාවර ගිණුමේ තැන්පත් කර ඇත. | ශක්‍යතා අධ්‍යයනය සිදුකර යූරියා පොහොර නිෂ්පාදනය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |